**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකවන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය - 2022**

---

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකවන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ (IV) ව්‍යවස්ථාවේ 04.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. ප්‍රමුඛ ප්‍රවාහන ව්‍යාපෘතියේ සූදානම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතු සැලසුම් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම යන එක් සංරචයක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,654.54කට සමාන එ.ජ.ඩො මිලියන 11.36ක් වන අතර ඉන් රු.මිලියන 1,456.50කට සමාන එ.ජ.ඩො. මිලියන 9.99ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 198.04ක් ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කරනු ලැබේ.

ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ ඌණතා

| විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ADB විසින් පවත්වාගෙන යන වාර්තාවට අනුව 2022 දෙසැම්බර් 31 දිනට පොලිය ලෙස එක්සත් ජනපද ඩොලර් 513,108.43 ක් ගෙවිය යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එහි සඳහන් වූයේ එක්සත් ජනපද ඩොලර් 380,000ක් ලෙසයි. එබැවින් මූල්‍ය ගාස්තුව රුපියල් මිලියන 45.4 කට සමාන එක්සත් ජනපද ඩොලර් 133,108 ක් මූල්‍ය ප්‍රකාශනයේ අඩුවෙන් දක්වා ඇත. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යටතේ ඉතිරි ණය පොලී ගාස්තු ගිණුම්ගත කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදිව සකස් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීමට නිවාස ඒකක ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ යටතට නොතිබුණද ශ්‍රී ලංකා රජයේ මුදලින් රු. මිලියන 5,412 ක පිරිවැයක් දරමින් නැවත පදිංචිකිරීමේ කටයුතු සඳහා නිවාස ඒකක 1244 ක් ඉදිකිරිමට ව්‍යාපෘති කාර්යාලය සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර අවබෝධතා ගිවිසුම් 6ක් අත්සන් කරන ලදී. ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දින අවසන් කරන ලද නමුත් වර්තමානය වනවිට නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා වෙන් කර තිබෙන්නේ නිවාස ඒකක 560ක් පමණි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 45ක් වූ බැවින් ඉලක්කගත ප්‍රගතිය අත්කර ගෙන නොතිබුණි. | නියමිත වේලාවට භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මුදල් නොලැබීම සහ පැවති COVID 19 බලපෑම හේතුවෙන් භෞතික ප්‍රගතිය ප්‍රමාද වී ඇත. | කැබිනට් අනුමැතියට අනුව ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතුය. |
| (ආ) | ඉදිරි වසර 20 තුළ ජාතික ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කොළඹ තදාසන්න ප්‍රදේශවල ශ්‍රී ලංකා දුම්රිය සේවය සංවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් රුපියල් මිලියන 1,506 ට සමාන එක්සත් ජනපද ඩොලර් 8,396,696 ක් ලබා දී තිබුණු අතර ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් සඳහා උපදේශන සේවා වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 1,447ක් වැය කර තිබිණි. මීට අමතරව, ඉහත ණය මුදල සඳහා මූල්‍ය පිරිවැය ලෙස එක්සත් ජනපද ඩොලර් 513,108ක් ගෙවා තිබුණි.2021 මාර්තු මාසයේදී මෙම ව්‍යාපෘතිය නිම කරන ලද අතර ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක සැලසුම් වාර්තා රේඛීය අමාත්‍යාංශය වෙත භාර දී තිබිණි. කෙසේවෙතත්, එම වාර්තා වසර දෙකකට වැඩි කාලයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ තිබුණ ද ඉහත වාර්තා භාවිත කරමින් දුම්රිය පද්ධතිය සංවර්ධනය කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබිණි. | TPPF යටතේ නිමැවුම්, ශක්‍යතා වාර්තා, සවිස්තරාත්මක සැලසුම් වාර්තා සහ කොළඹ තදාසන්න කලාපයේ දුම්රිය කොරිඩෝ හතර සඳහා ලංසු ලේඛන 2021 අප්‍රේල් 30 වන විට ලැබී තිබෙන අතර ඒවා ඉදිරි අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා SLR, NPD සහ ප්‍රවාහන අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. | දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා හැකි ඉක්මනින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගැටළු

| විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම්, සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන් කිරීමේ පද්ධතිය සහ දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ව්‍යාපෘතියේ අරමුණු නොවූ අතර ඒවා කලින් කලට කැබිනට් තීරණ මගින් ව්‍යාපෘතියට සම්බන්ධ කරනු ලැබේ. වියදම් වාර්තාව අනුව පහත සඳහන් වියදම් ව්‍යාපෘතියේ පිරිවැය ලෙස ගිණුම්ගතකර තිබුණි.<br><br>(i) සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය සඳහා අපදේශක සේවා ගාස්තු වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදලින් රු. මිලියන 19.21ක් ගෙවා තිබුණි.<br><br>(ii) නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීමට සහ සමාජ සමීක්ෂණයක් සිදුකිරීමට UN-Habitat වෙත දේශීය අරමුදල්වලින් රු.මිලියන 150.60ක් ගෙවා තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 20.08ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතිණි.<br><br>(iii) දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් විදේශීය උපදේශක සේවා ගාස්තු වශයෙන් රුපියල් මිලියන 2.89 ක මුදලක් ගෙවා තිබුණි............. | තවත් ක්‍රියාකාරකම් කිහිපයක් හඳුනාගෙන ඒවාට මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ විය. ඒ අනුව, REIP ව්‍යාපෘතිය නිර්මාණය කරන ලද අතර TPPF හි අරමුදල් උපයෝගී කර ගනිමින් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීමට නියමිතය.<br><br>. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල විෂය පථය සමාලෝචනය කළ යුතු අතර ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව වියදම් කළ යුතුය. |

## 3.3 පද්ධති හා පාලනයන්

| විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ඇස්තමේන්තුගත පිරිවැය එක්සත් ජනපද ඩොලර් 500,000 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එක්සත් ජනපද ඩොලර් 665,351ක් වැය කර තිබෙන අතර එය එම කාල සීමාව තුළ පුරෝකථනය කරන ලද එක්සත් ජනපද ඩොලර් 500,000 මුදල රු. මිලියන 30.8 කට සමාන එක්සත් ජනපද ඩොලර් 165,351 කින් ඉක්මවා යාමකි. | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබා දුන් උපදෙස් අනුව, PMU පිරිවැය ඉතිරිකිරීම් දුම්රිය සංරචකයට නැවත ලබා දීම සඳහා මාර්ග සංරචකයෙන් මූලික එකඟතාව ලබා ගන්නා ලදී. | ව්‍යාපෘති පරිපාලන අත්පොත ප්‍රකාරව අනුව වියදම් දැරීම සිදුකළ යුතුය. |